# සුපිළිපන්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා - පුවත් හසුන - ජූලි 2012

ට්‍රාන්ස්පේරන්සි
ඉන්ටනැෂනල්
ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

නො 6, 37 වෙනි පටුමග, රැපීන පාර, කොළඹ 03
දුරකථනය - 011 4369781 ෆැක්ස් - 011 2506419
ඊ මේල් - tisl@tisrilanka.org
වෙබ් අඩවිය - www.tisrilanka.org

## රටේ දුප්පත්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නගාසිටුවීමට

# අපේ සහායෙන් සංවර්ධන සැලැස්මක්

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පෙරමුණ ගනිමින් ශ්‍රී ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ලෙස පිළිගැනෙන බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රදේශය දියුණුකිරීම සඳහා සකස් කෙරුණු සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම කාගේත් ප්‍රසාදයට ලක්වී ඇත.**

යහපාලනය වර්ධනය උදෙසා ප්‍රජා සහභාගිත්වයෙන් පිළියෙල කෙරුණු එම සැලැස්ම ප්‍රජා නායකයින්, මහජන නියෝජිතයින් සහ රජයේ නිලධාරීන් විසින් ඒකමතිකව අනුමත කෙරුණි.

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා සභාපති කරු වීරරත්න මහතා සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම හැඳින්වූයේ රටේ දුප්පත්ම ප්‍රදේශය නමින් සිතියම්ව ඇති රිදීමාලියද්ද නාමය දුෂ්කර සිතියමින් පහ කිරීමට දරන ප්‍රයත්නයේදී සුබවාදී මාවතක, සුබවාදී පෙර දැක්මක මං සලකුණක් ලෙස ය.

ප්‍රාදේශීය සභාවක් පළාත් පාලන ආයතනයක් සේ ක්‍රියාකිරීමේදී පොදු උපයෝගීතා සේවාවන් ජනතාවගේ සුබවිහරණය, පහසුව හා සුබ සාධනයට අවශ්‍ය පරිදි විධිමත් කිරීමට බැඳී ඇතැයි හෙතෙම කියයි.

ප්‍රාදේශීය සභා සභාපති සහ සභිකයින්ගේ ඉල්ලීමක් අනුව අප ආයතනය මුල්ව පළාත් පාලනය පිළිබඳව මනා පළපුරුද්දක් ඇති පියතිස්ස රණසිංහ මහතාගේ ප්‍රමුඛත්වයෙන් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ඇරඹුණි. සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම්වරයාව සිටි හෙතෙම තවත් රජයේ තනතුරු කීපයක් උසුලා රජයේ සේවයෙන් විශ්‍රාම යෑමට කලින් අමාත්‍යාංශ ලේකම්වරයකුව සිටියේය. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයේ අජිත් රත්නායක සහ අයි.එච්.එම්.විජේසුන්දර දෙපළ ද ඒ කාර්යයට හවුල්වූහ. අප ආයතනයේ සභාපති එම්.ඩී.ඒ. හැරල්ඩ් මහතා මූලික සාකච්ඡාවලට සහභාගිවූ අතර කළමනාකාරිණී නෞලි විමලරත්න සම්බන්ධීකරණ කටයුතු භාරව ක්‍රියාකළාය.

සංවර්ධන සැලැස්ම සාකච්ඡා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභිකයින් සහ ග්‍රාම නිලධාරී වසම් 42 ක ජනතාව නියෝජනය කළ ප්‍රජා නිලධාරීන් 250 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් වැඩ මුළු හයක් පවත්වන ලදී.

ප්‍රජා නිලධාරීන් විසින් ප්‍රදේශයේ ඇති සමාජයීය හා ආර්ථික අවශ්‍යතා සහ ගැටලු හඳුනා ගැනීමෙන් පසු විවිධ මාතෘකා යටතේ ඒවා පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුණි. භෞතික හා යටිතල පහසුකම්, සෞඛ්‍ය හා සනීපාරක්ෂක, පරිසර කළමනාකරණ, සමාජ සංවර්ධන සහ ආර්ථික සංවර්ධන යන අංශ යටතේ එම සාකච්ඡා පැවැත්විණ. එම සාකච්ඡා පදනම් කරගෙන සැලසුම්කරණ කමිටුව විසින් ඒ ඒ අංශ යටතේ ව්‍යාපෘති සහ වැඩ විෂයයන් සකස් කෙරුණි.

සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පිළියෙල කෙරුණු විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මෙහි ඒ ඒ කාර්යයන් භාර නිලධාරීන් මෙන්ම ගතයුතු පියවර සහ ඉලක්ක කාල සීමවන් ද නියම කෙරුණි. එක් එක් වර්ෂය අනුව ව්‍යාපෘති සඳහා අපේක්ෂිත ආයෝජනයන් ද වෙන් කෙරුණි.

සැලැස්ම ප්‍රාදේශීය සභා සභිකයින් විසින් ඒකමතිකව අනුමත කරනු ලැබූ අතර විවිධ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු දැන් අරඹා ඇත. ඒ අතර, එම යෝජනා ක්‍රම පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය අප ආයතනය විසින් කරගෙන යනු ලැබේ.



# සුපිළිපන්භාවය පිළිබඳ තරුණ අදහස් විමසන සමීක්ෂණයක් ඇරඹේ



**අල්ලස, දූෂණය හා සුපිළිපන්භාවය පිළිබඳ තරුණ තරුණියන්ගේ ආකල්ප මැන බැලෙන සමීක්ෂණයක් අප ආයතනය විසින් ආරම්භ කර තිබේ.**

ශ්‍රී ලංකාවේ පළාත් නමයම ආවරණය වන පරිදි සිදුකෙරෙන මෙම සමීක්ෂණය ජාතික තරුණ සේවා සභාවේ පූර්ණ සහයෝගය ඇතිව ක්‍රියාත්මක වන අතර එහි සමීක්ෂකවරු ලෙස යෞවන සමාජ සාමාජිකත්වය දරන තරුණ තරුණියෝ කණ්ඩායමක් කටයුතු කරති.

මෙම සමීක්ෂකවරු හා ක්ෂේත්‍ර පරීක්ෂකවරු පුහුණු කිරීමේ වැඩමුළු දෙකක් පසුගිය මැයි 17 - 18 හා 28 යන දිනවල මහරගම ජාතික තරුණ සේවා සභා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙ සමාජ විද්‍යා අංශ ප්‍රධානි ආචාර්ය ශාන්ත අබේසිංහ මෙම සමීක්ෂණය භාරව කටයුතු කරයි.

# අල්ලස් - දූෂණ මැඩලීමට ගවේෂණාත්මක මාධ්‍යවේදීහු එක්වෙති

**ගවේෂණාත්මක මාධ්‍යකරණ පුහුණු වැඩසටහන් තුළින් ලැබූ දැනුම උපයෝගීකරගනිමින් දූෂණය මැඩලීමේ සමාජ මෙහෙවරට දායකවීමට තමන් සූදානම් බව අනුරාධපුරය, පොළොන්නරුව හා අම්පාර දිස්ත්‍රික්කවල පුහුණුව ලැබූ ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීහු පවසති.**

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය මගින් සම්පාදනය කරන ලද ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ පුහුණු මොඩියුලය, සම්පත් ග්‍රන්ථය හා අත්පොත් ආධාර කරගනිමින් සංවිධානය කළ වැඩමුළු හතරක් පසුගිය අප්‍රේල් - ජූනි මාසවල එම දිස්ත්‍රික්කවලදී පැවති අතර පුහුණුව අවසානයේදී ඔවුහු මේ අදහස් පළකළහ.

මෙම වැඩමුළුවලදී ගුවන් විදුලි, රූපවාහිනි හා මුද්‍රිත මාධ්‍යකරණයේ නියුතු සිංහල මාධ්‍ය ජනමාධ්‍යවේදීන් 62 දෙනෙකු හා දෙමළ මාධ්‍ය 18 දෙනෙකු වශයෙන් ප්‍රාදේශිය ජනමාධ්‍යවේදීන් 80 දෙනෙක් නව ගවේෂණාත්මක වාර්තාකරණ මොඩියුලය යටතේ පුහුණුව ලැබූහ.

'ලොස් ඇන්ජලීස් ටයිම්ස්" පුවත්පතේ හිටපු ගවේෂණාත්මක වාර්තාකරුවෙකු හා ජනමාධ්‍ය උපදේශකවරයෙකු වන රැල්ෆ් ෆ්රැමලිනෝ මහතා සහ ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදීන් හා මාධ්‍ය පුහුණුකරුවන්ගේ සහාය ඇතිව සම්පාදනය කරන ලද මෙම පුහුණු මොඩියුලය යටතේ දිවයින පුරා විසිරී සිටින ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් හා කර්තෘ මාණ්ඩලිකයින් සඳහාද විශ්ව විද්‍යාලවල ජනමාධ්‍ය විෂය හදාරන විද්‍යාර්ථීන් සඳහාද පුහුණු වැඩසටහන් පැවැත්වෙනු ඇත.

දූෂණය දුරලීම සඳහා ගවේෂණාත්මක වාර්තාකරණය ඉහළ නැංවීමේ අරමුණින් 2007 වසරේදී අප ආයතනය මගින් ආරම්භකරන ලද ජනමාධ්‍ය පුහුණු වැඩසටහන් යටතේ මේ වන විට කුරුණෑගල, බදුල්ල, අනුරාධපුරය, අම්පාර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් 230 කට අධික ප්‍රමාණයක් පුහුණුව ලබා තිබේ. ඔවුන් සියලු දෙනා දූෂණයට එරෙහි ජනමාධ්‍යවේදී ජාලයක් ලෙස අප ආයතනය සමඟ සම්බන්ධව සිටිති.

ෆ්‍රෙඩ්රික් ඊබට් පදනම හා යුරෝපා සංගමය මෙම ගවේෂණාත්මක වාර්තාකරණ පුහුණු වැඩසටහන් සඳහා මූල්‍ය අනුග්‍රහය සැපයීය.



# ප්‍රාදේශීය පාලනය තුළ වගවීම ඉහළ නැංවීම

# 'වසරක පිය සටහන්' සැමරේ



අප ආයතනය අම්බලන්ගොඩ නගර සභාව සහ යක්කලමුල්ල හා අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සමඟ එක්ව ක්‍රියාත්මක කළ ප්‍රාදේශීය පරිපාලනයෙහි ප්‍රජා සහභාගීත්වය සහ වගවීම ඉහළ නැංවීමේ වැඩසටහන් මාලාවේ පසු විපරම "වසරක පිය සටහන් " ප්‍රදර්ශනය හා සාකච්ඡා මණ්ඩපයක් පසුගියදා යක්කලමුල්ල හර්ෂා රිසෝට් හීදී පැවැත්විණි.

මෙම වැඩසටහනේ මූලික අරමුණ වූයේ පසුගිය වසරේ ක්‍රියාත්මක කළ කටයුතු සමාලෝචනයට ලක්කිරීම හා ඉදිරි වසර සැලසුම් කිරීමේදී විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ගේ හා මහජනතාවගේ අදහස් ලබාගැනීමය.

මෙම වැඩසටහනට සමගාමීව අල්ලස් - දූෂණ පිළිබඳ පෝස්ටර් තරගයේ ජයග්‍රාහී නිර්මාණ හා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ක්‍රියාකාරකම් ඇතුළත් ප්‍රදර්ශනයක්ද පැවැත්විණි. නගර සභා හා ප්‍රාදේශීය සභා ප්‍රධානීන්, අප ආයතනයේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින්, පාසැල් සිසුන්, ප්‍රදේශයේ මහජනතාව ඇතුළු විශාල පිරිසක් ඊට සහභාගී වූහ.



**"මේ දූෂණයන් මැඬලා මොහොතක් - අපි අවට බලමු ඇස් ඇරලා නැති බැරිකම් සතර අතේ පාවෙනවා සුළඟ වගේ......."**

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය අභ්‍යාසලාභී උපාධිධාරීන් ඉදිරිපත්කළ වීදි නාට්‍ය සංදර්ශනයේ අවස්ථාවක්.




### මේ නිර්මාණය මට අලුත් අත්දැකීමක් වුණා

"මේ වගේ තේමාවක් යටතේ නිර්මාණයක් කළේ ප්‍රථම වතාවටයි. ඒ සඳහා අල්ලස - දූෂණය ගැන කරුණු රැසක් හදාරන්න සිදු වුණා. දූෂණය අපේ රටේ දිළිඳු ජනතාවට මොනතරම් අහිතකර ආකාරයෙන් බලපානවාද? දූෂණයේ හානිය ගැන තවත් එක් පුද්ගලයෙකු තුළ හෝ ආකල්පමය වෙනසක් ඇතිකරන්න නිර්මාණකරණයෙන් දායකවෙන්න ලැබීම මට ලොකු සතුටක්.

**- එම්. ටී. නිශාන්ති**

විවෘත අංශයේ ප්‍රථම ස්ථානය දිනූ ජයග්‍රාහිකාව

### මේ පිළිගැනීම මට විශාල ධෛර්යයක්

පුංචි කාලේ ඉඳන් අල්ලස - දූෂණයේ හානිය අපට දැනුනත් පොඩි ළමයි විදියට අපට ඒ ගැන කළහැක්කේ කුමක්ද කියල අවබෝධයක් තිබුණේ නෑ. අපි යමක් කළත් වැඩිහිටියෝ එය පිළිගනීද කියන සැකයකුත් හිත තුළ තිබුණා. ඒත් මගේ නිර්මාණයට ලැබුණ පිළිගැනීමත් එක්ක ඒ හැඟීම සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. අදහස් ප්‍රකාශනයේ මාධ්‍යයක් ලෙස චිත්‍රය හරහා සමාජයට ලොකු සේවයක් කළ හැකියි. ඉදිරියේදී මම චිත්‍ර ප්‍රදර්ශනයක් පවත්වන්න බලාපොරොත්තු වෙනවා.

**- නබඳව විතානගේ විකුම් මධුසංක**

කනිෂ්ඨ අංශයේ ප්‍රථම ස්ථානය දිනූ ජයග්‍රාහකයා

## වසරක අස්වැන්න ගැන පළවූ අදහස්



### අපට ලැබුණ දැනුම හා පුහුණුව ඉතා වැදගත්

80 දශකයේ අපේ නගර සභාව වසර 4ක්ම හොඳම නගර සභාව හැටියට සම්මාන ලැබුවා. මෑත කාලය තුළදී දකුණු පළාත තුළ හොඳම නගර සභාව වෙන්න අපට හැකි වුණත් ජාතික මට්ටමින් ප්‍රධාන ස්ථානයක් දිනාගන්න බැරිවුණා. අපි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් වැඩසටහනින් අපේක්ෂා කළේ නැවත පැරණි ජයග්‍රාහී තත්ත්වයට පත්වීමට අප තුළ පවත්නා අඩුපාඩු හඳුනාගනිමින් ඊට සුදුසු විසඳුම් සෙවීමයි. මෙම වැඩසටහන් මාලාව හරහා අපට ලැබුණ දැනුම, පුහුණුව ඉතාම වැදගත්. ඉතාම සියුම් විදියට අපට අවශ්‍ය දේ කුමක්දැයි අධ්‍යයනය කරමිනුයි ඔවුන් එම වැඩසටහන් ක්‍රියාත්මක කළේ.

මේ වනවිට අපේ නගර සභාව වඩාත් සමීප වූ ජනතාවාදී පාලනයක් බවට වැඩිදියුණු කිරීමට හැකිවී තිබෙනවා. ඒ සඳහා අපව මෙහෙයවීම සහ මංපෙත් හෙළිපෙහෙළි කරදීම ගැන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට ස්තූති කළ යුතුයි.

**- අම්බලන්ගොඩ නගරාධිපති නීතීඥ අරුණ ප්‍රදීප්**



### අපේ ප්‍රාදේශීය සභාව තුළ විශාල ප්‍රබෝධයක් ඇතිවුණා

ප්‍රාදේශීය සභාවක් ලෙස අපට ලිපිගොණු පවත්වාගෙන යාමේ නිසි ක්‍රමවේදයක් තිබුණේ නෑ. අපට ගබඩාවක් හෝ ලේඛනාගාරයක් තිබුණොත් නැහැ. ඒ සියල්ල විධිමත්ව පවත්වාගෙන යාමේ දැනුම අපට ලැබුණේ මෙම වැඩසටහන මගිනුයි. ට්‍රාන්ස්පේරන්සි ආයතනය අපව සම්බන්ධකරගෙන සැළසුම් සකස්කර දැනුම හා පුහුණුව ලබාදුන්නා පමණක් නොවෙයි; එය නිවැරදිව කරනවද කියලා අධීක්ෂණය කළා. ඒ නිසා කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ඒ අනුව වෙනස් නොවී ඉන්න බැරිවුණා.

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා ඉතිහාසයේ කිසිම දිනක සභාවේ මහජන ගැලරිය ජනතාව වෙනුවෙන් විවෘත වී තිබුණේ නෑ. අද පාසල් දරුවන් වගේම ප්‍රදේශයේ ජනතාව මහජන ගැලරියේ ඉදගෙන තමන් පත්කරලා යවපු මහජන නියෝජිතයින් මොනවද කතාකරන්නේ කියලා අහගෙන ඉන්නවා. මහජනතාව ගැලරියේ ඉන්න නිසා මහජන නියෝජිතයින්ට ඔවුන්ගේ ප්‍රශ්න කතා නොකර ඉන්න බෑ.

අපේ මුදල් කමිටුව හැර සෙසු කමිටු තුනටම මේ වනවිට මහජනතාව අතරින් නියෝජිතයින් සහභාගි වෙනවා. නවක සභාපතිවරයෙක් ලෙස පෞද්ගලිකව මා තුළත් මේ වැඩසටහන් මගින් විශාල වෙනසක් ඇතිකළා.

**- චන්දිම ලියනගේ - සභාපති, - යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**



### රාජ්‍ය නොවන සංවිධාන ගැන තිබූ වැරදි ආකල්පය වෙනස් වුණා

මම සභාපති හැටියට පත්වෙලා තවම අවුරුදු දෙකයි. නවකයෙක් ලෙස, ප්‍රාදේශීය සභාවේ කටයුතු වඩාත් සාර්ථක කරගන්නේ කොහොමද කියන සොයාබැලීමක යෙදී සිටියදීයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය හමුවුණේ.

ඇත්තටම පසුගිය වසරක කාලය තුළ අපට නව දැනුම හා අප තුළ පවත්නා හැකියාවන් වර්ධනය කරගැනීමට කළමණාකරණය ගැන අත්දැකීම් රැසක් ලැබුණා. වාරියපොළ ප්‍රාදේශීය සභාව ගැන අධ්‍යයනය කරන්න ලැබුණ අවස්ථාවත් ඉතාම වැදගත්.

සාමාන්‍යයෙන් රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු ගැන සමාජය තුළ තිබෙන්නේ වැරදි ආකල්පයක්. මේ වැඩසටහන මගින් ඒ වැරදි ආකල්පය වෙනස් කළා.

**- පුෂ්පලාල් කුමාරතුංග - සභාපති අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

# 'ඉඩම් කඩම් දැනමුතුකම්' එළිදකී




රජයේ ඉඩම්ලාභී ජනතාව මුහුණදෙන ඉඩම් ගැටලු අවම කරගැනීමට සහයවීමේ අරමුණින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සම්පාදනය කරන ලද "ඉඩම් කඩම් දැනමුතුකම්" ග්‍රන්ථය එළිදැක්වීම ජූනි 28 වැනිදා අනුරාධපුරය මහ බැංකු ශ්‍රවණාගාරයේදී සිදු කෙරිණි. එහිදී එම ග්‍රන්ථයේ මුල් පිටපත පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් නිමල් අබේසිරි මහතා වෙත පිළිගන්වනු ලැබීය.

ඉඩම් ගැටලු නිසා ජනතාව අල්ලස - දූෂණයට ගොදුරුවීමට ඇති ඉඩකඩ අවම කිරීමේ අරමුණින් සරල බසින් සම්පාදනය කර ඇති මෙම ග්‍රන්ථය මගින් ඉඩම් හඳුනාගැනීමේ සිට රජයේ ඉඩම්වලට අදාළ පනත්, ඉඩම් බලපත්‍ර ලබාගැනීම්, ඉඩම් පැවරීම්, හුවමාරු කිරීම් උකස් තැබීම, ඉඩම් ආරවුල් විසඳාගැනීම ආදී විවිධ විෂය ක්ෂේත්‍ර රැසක් පිළිබඳව සාකච්ඡා කර තිබේ.

# යහපාලනය නංවාලීමට තවත් ප්‍රදේශීය සභා සමග එක්වෙයි



අප ආයතනය USAID ආයතනයේ ද සහයෝගය ඇතිව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර සහ අම්පාර දිස්ත්‍රික්කයේ ආලියඩිවෙම්බු ප්‍රාදේශීය සභා සමග එක්ව යහපාලනය නංවාලීමේ ව්‍යාපෘතියක් පසුගියදා ඇරඹුණි.

මෙම ව්‍යාපෘතියේ අරමුණ ප්‍රාදේශීය සභාව පිළිබඳවත් එමගින් සපයනු ලබන සේවා පිළිබඳවත් මහජනතාව තුළ අවබෝධය නංවාලීම සහ එම සේවාවන්හි ගුණාත්මක භාවය වැඩිදියුණු කරගැනීමට ඔවුන්ට මැදිහත් විය හැකි ආකාරය පිළිබඳව දැනුම්වත් කිරීමයි. එසේම ප්‍රාදේශීය සභා නිලධාරීන් සහ මහජන නියෝජිතයින්ට තම කාර්යභාරයන් වඩාත් වගකීමකින් සහ වගවීමෙන් යුතුව ඉටුකරන අයුරු සහ ප්‍රාදේශීය සභාවේ කටයුතු වලට මහජනතාවගේ සක්‍රීය දායකත්වය ලබාගැනීම පිළිබඳවත් දැනුම්වත් කිරීම මෙහිදී සිදුවේ. මෙමගින් එකිනෙකාගේ දැනුම අවබෝධය වර්ධනය වීම තුළින් සභාවේ වැඩකටයුතු වඩාත් සුපිළිපන් බවට පත්කිරීම මෙම වැඩ සටහනේ පරමාර්ථය වේ.

# දූෂණ හෙළිකරන ගුවන්විදුලි වැඩසටහන්වලට ඉහළ ප්‍රතිචාර

**"විනිවිද" වැඩසටහනටත් "මරු පරිමානම්" ද්‍රවිඩ වැඩසටහනටත් හොඳ ප්‍රතිචාරයක් තියෙනවා. අපි යම් දූෂණයක් අක්‍රමිකතාවයක් ගැන ගුවන් විදුලියෙන් පෙන්වා දුන්නට පස්සේ විවිධ පළාත්වල සිදුවෙමින් තිබෙන ඊට සමාන දේවල් ගැන අපේ ශ්‍රාවකයෝ අපට කතාකරලා කියනවා. "**

**"සමහරු අපිට කතාකරන්නෙම නිලධාරීන් බැනවදින ඒවා නැත්නම් අයුතු යෝජනා කරන ඒවා තමන්ගේ ෆෝන්වලින් රෙකෝඩ් කරගෙන. ඒවත් පාවිච්චි කරලා තමන්ගේ ප්‍රශ්න ගැනත් "විනිවිද" වැඩසටහනක් කරන්න කියලයි ඔවුන් ඉල්ලන්නේ"**

**"මේ ගුවන් විදුලි වැඩසටහන් වෙනුවෙන් තොරතුරු සොයද්දී සේවක අර්ථසාධක අරමුදල් වංචා කිරීම්, දුප්පතුන් රවටා EPF මුදල් බලහත්කාරී ලෙස ලබාගැනීම්, සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල දූෂණ, සමෘද්ධි කොන්ත්‍රාත් හා බැඳුන දූෂණ වගේ ක්ෂේත්‍ර රැසක් ගැන අපිට තොරතුරු ලැබුණා. මේ සමහර ගැටලු ගැන අපි අදාළ බලධාරීන්, විෂයභාර අමාත්‍යවරුන් දැනුම්වත් කළා. ඇත්තටම ඔවුන්ගෙන් ඉතාම යහපත් ප්‍රතිචාර ලැබුණා"**

ඌව ප්‍රජා ගුවන් විදුලියේ වැඩසටහන් නිෂ්පාදකවරුන් හා ගුවන් විදුලි මාධ්‍යවේදීන් මේ අදහස් පළකළේ දූෂණ විරෝධී දැනුම මහජනතාව අතරට ගෙනයාම සඳහා සම්පාදනය කෙරෙන "විනිවිද" හා "මරුපරිමානම්" වැඩසටහන් පිළිබඳව පසුගියදා පැවති පසු විපරම් වැඩසටහනට සහභාගී වෙමිනි. මෙම ගුවන් විදුලි වැඩසටහන් මගින් අල්ලස් දූෂණ හඳුනාගැනීම හා ඒවා වැළැක්වීම, ප්‍රාදේශීය පාලනය තුළ මහජන සහභාගීත්වය, තොරතුරු දැනගැනීමේ අයිතිය, මහජන පැමිණිලි විමර්ශන යාන්ත්‍රණ, පුරවැසි අයිතිවාසිකම් ආදී විවිධ ක්ෂේත්‍ර පිළිබඳව මහජන දැනුම්වත්භාවය පුළුල් කෙරේ.



"විනිවිද" සිංහල වැඩසටහන සෑම දෙසතියකම වරක් බදාදා උදෑසන 7.00 සිට 7.30 දක්වාද මරුපරිමානම් ද්‍රවිඩ වැඩසටහන දෙසතියකට වරක් රාත්‍රී 7.30 සිට 8.00 දක්වාද FM 98.4 ඔස්සේ ඌව ප්‍රජා ගුවන් විදුලියෙන් ප්‍රචාරය කෙරේ.









## කාලීන ප්‍රශ්න සමාජ සංවාදයට ලක්කරන

# “සම්භාෂණ”

කාලීන ප්‍රශ්න සමාජ සංවාදයට ලක්කෙරෙන "සම්භාෂණ" මහජන සංවාද මණ්ඩපය යටතේ පසුගිය මාස කිහිපය තුළ ප්‍රමුඛ ප්‍රශ්න කිහිපයක් කෙරෙහි මහජන අවධානය යොමු කෙරිණි.

කෝප් වාර්තාව එළිදැක්වීමත් සමඟ "කෝප් හෙළිදරව්වේ හෙට දවස? " පිළිබඳවද , විශ්ව විද්‍යාල අර්බුදය" , රුපියල අවප්‍රමාණය වෙමින් මතු වූ "රුපියලේ අර්බුදය" හා "කොටස් වෙළඳපොලේ අභ්‍යන්තර ගනුදෙනු" පිළිබඳ මහජන සංවාද මණ්ඩප කොළඹදීද, මහජනතාව මුහුණ දී සිටින ඉඩම් ගැටලු පිළිබඳ සංවාද මණ්ඩපයක් "ඉඩම් කඩම් දැනමුතුකම්" ග්‍රන්ථය එළිදැක්වීමට සමගාමීව අනුරාධපුරයේදී ද පැවැත්විණ. විද්වතුන්, සමාජ ක්‍රියාකාරීන්, ජනමාධ්‍යවේදීන් ඇතුළු එම විෂය ක්ෂේත්‍ර පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයින් රැසක් එම සංවාද මණ්ඩපවලට සහභාගී වූහ.

"සම්භාෂණ" සංවාද මණ්ඩපය ජනමාධ්‍යයට හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පුරවැසියන් සැමට විවෘතය. සංවාද මණ්ඩපය අවසානයේ එම විෂය ක්ෂේත්‍ර පිළිබඳ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා තත්ත්ව වාර්තාවක් නිකුත් කෙරේ.






## නව සාමාජිකයින් 17 දෙනෙක්

අප ආයතනයේ වාර්ෂික සභා රැස්වීමේදී නව සාමාජිකයින් 17 දෙනෙක් අපට එක්වූහ. ජූනි 26 වෙනිදා පවත්වන ලද රැස්වීමේදී සාමාජිකත්වය ලැබූ අය අතර වෘත්තිකයින්, මාධ්‍යවේදීන් මෙන්ම ජාතික සුපිළිපන් ප්‍රණාම ලාභියෙකු සහ අප ආයතනය විසින් සංවිධානය කෙරුණු තරගවල ජයග්‍රාහකයින් ද වෙති.

එදින පැමිණ සිටි අනෙකුත් සාමාජිකයින් සමග එක්ව ඔවුහු ආයතනයේ කටයුතු වලට අනාගතයේදී හවුල්විය හැකි ආකාරය ගැන අදහස් ඉදිරිපත් කළහ.

වාර්ෂික රැස්වීම පවත්වන ලද්දේ සභාපති එම්.ඩී.ඒ.හැරල්ඩ් මහතාගේ ප්‍රධානත්වයෙනි. ආයතනයේ සාමාජිකත්වය ලබාදෙන ලිපි ඔහු විසින් නව සාමාජිකයින් වෙත පිළිගන්වන ලදී.



## ජාතික සුපිළිපන් ප්‍රණාම සඳහා නාමයෝජනා කැඳවයි

ශ්‍රී ලංකාව තුළ අල්ලස - දූෂණය  අවම කිරීමට සහ යහපාලනයක් ඇති කිරීම වෙනුවෙන් පුරෝගාමී මෙහෙවරක නිරත වූ පුද්ගලයින් හා සංවිධාන වෙත ප්‍රණාම පිදෙන ජාතික සුපිළිපන් ප්‍රණාම 2012 සඳහා නාම යොජනා කැඳවනු ලැබේ.

2004 වසරේදී ආරම්භකරන ලද 'ජාතික සුපිළිපන් ප්‍රණාම' වැඩසටහන යටතේ රාජ්‍ය නිලධාරීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන්, ගවේෂණාත්මක ජනමාධ්‍යවේදීන්, ආගමික නායකයින් ඇතුළු දස දෙනෙක් ප්‍රධාන සම්මානයෙන් පිදුම් ලබා ඇති අතර තවත් පස් දෙනෙක් විනිශ්චය මණ්ඩලයේ විශේෂ ඇගයීමටද පාත්‍ර වී තිබේ. සුපිළිපන් ප්‍රණාම සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය අගෝස්තු 31 වැනිදාය. 011 5627432 ඔස්සේ තිළින ඇමතීමෙන් හෝ නො 06, 37 වන පටුමඟ, රැජින පාර, කොළඹ 03 යන අපගේ ලිපිනයට ලිවීමෙන් වැඩි විස්තර හා අයදුම්පත් ලබාගත හැකිය.

සම්මාන ප්‍රදානය අන්තර් ජාතික දූෂණ විරෝධි දින (දෙසැම්බර් 09) කොළඹදී සිදු කෙරේ.

**වැඩි විස්තර සඳහා අමතන්න**

**011-5627432**




**අල්ලස් - දූෂණය නිසා පීඩා විඳින, අල්ලස් - දූෂණ විධිමත්ව හෙළිදරව් කිරීමට උත්සාහ දරන**
**අල්ලස් - දූෂණ වැළැක්වීමට ගොස් අමාරුවේ වැටී සිටින**

ඔබට නොමිලේ නීති උපදෙස් ලබාදීමට අප සූදානම්

**කතා කරන්න 011 20 55 255**

සුසැරි සෙවණ - දූෂණයට එරෙහි නීති උපදේශන සේවය
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, අංක 06, 37 වෙනි පටුමඟ, කොළඹ 03
ඊ මේල් help@tisrilanka.org